# 24

# නබි නූහ් අලයිහිස්සලාම් තුමා

ආදම් අලයිහිස්සලාම් තුමාගෙන් පසු ෂීද් අලයිහිස්සලාම් තුමාණෝ නබිවරයෙකු ලෙස පහළ වූහ. එකල ජනයා මේ දෙදෙනා ඉගැන්වූ පරිදි අල්ලාහ් විශ්වාස කළහ. ඔහුගේ අණට කීකරු වී මුස්ලිම්වරු ලෙස ජීවත් වූහ. මෙසේ ජන සමාජයේ ආරම්භයේ සිට ඉස්ලාම් ලොවේ පූර්ණ කාලීන ආගමක් ලෙස පැවතෙයි.

ඔවුන්ට පසු දේව ධර්මය ජනයාට ඉගැන්වීමේ කාර්යය වියතුන් 5 දෙනෙකු විසින් කෙරුණි. අල්- කුර්ආනය තුළ වද්දු, සුවාඋ, යකූසු, යඋෘකු හා නස්රු යන ආදී නම්වලින් ඔවුහු ආමන්ත්‍රණය කෙරෙති. කාලය ගත වූ පසු ඔවුහු ජනයා ඉදිරියේ ප්‍රසිද්ධියට පත්වූහ. ඔවුහු ගෞරවයට පාත්‍ර වූහ. මේ පඬිවරුන්ගේ මාර්ග උපදේශන පරිදි ජනයා ඉස්ලාමය ස්ථිර ව පිළිපදිමින් ආහ. මේ නිසා ෂෙයිතාන්ට ජනයා නොමග යැවීමට නොහැකි විය.

මෙම පඬිවරුන් පස් දෙනා ම මරණයට පත් වූ පසු ගරු කිරීමට පිළිම සකස් කර එයට නැමදුම් කරන ලෙසත් ෂෙයිතාන් එම ජනයන් උසි ගැන්වූවේ ය. එදා සිට ලොව තුළ ෂිර්ක් බිහි විය.

මේ මොහොතේ ජනයා යහමග යැවීම සඳහා අල්ලාහ් විසින් නබි නූහ් අලයිහිස්සලාම්තුමා යවන ලදි. මොහු එක දිගට ම අවුරුදු 950ක් ෂිර්ක් වලින් මිදී අල්ලාහ්ට පමණක් නැමදුම් කරන ලෙස එම ජනයාට ආරාධනා කළේ ය. මේ කාර්යය ඔහු රෑ, දවල් නොතකා කළේ ය. තනි පුද්ගලයන් හට රහසිගත ව ඒ ප්‍රවෘත්තිය දන්වන ලදි. ජනයා රැස්වෙන තැන්වල ප්‍රසිද්ධියේ ආරාධනය කළේ ය. නමුත් ඔවුහු ඒ ප්‍රවෘත්තිය තමන්ගේ කනට නො ඇසෙන ලෙස කන් දෙක තම ඇඟිලිවලින් තදින් වසා ගත්හ. නබි නූහ් අලයිහිස්සලාම් තුමා දකින විට තමන්ගේ රෙදිවලින් මුහුණු වසාගත්හ. ඔහුගේ සමාජයේ සුළු ප්‍රමාණයක් විශ්වාස කළේ ය. බිරිඳ මෙන් ම තම පුත්‍රයා ද ඔහු ප්‍රතික්ෂේප කළෝ ය.

නබි නූහ් අලයිහිස්සලාම් දෙවියන් එක්කෙනකු බව පවසමින් සොබාදහමේ ඇති සලකුණු බොහෝ පෙන්වා තමන්ගේ සමහරු සමග තර්ක කළේ ය. ඔවුහු ඔහුට දැඩි ලෙස හිංසා කළහ. ඔහු කියා නිම කළ නොහැකි පීඩාවලට ගොදුරු විය. සත්‍ය මාර්ගය සඳහා කෙසේ ආරාධනා කළත් ඔවුන් විශ්වාස කරන්නේ නැත යනුවෙන් අල්ලාහ් නබි නූහ් අලයිහිස්සලාම් තුමා වෙත දැන්වූවේ ය. එසේනම් ඔවුන්හට දඬුවම් කර විනාශ කර දමන ලෙස ඔහු අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළේ ය.

කාෆිර්වරුන් විනාශ කිරීමට එක්තරා ජලගැල්මක් සිදුවන බව අල්ලාහ් ඔහුට දැන්වූවේ ය. ඒ මොහොතේ විශ්වාසවන්තයන්ගේ ආරක්ෂාවට එක් නැවක් නිර්මාණය කරන ලෙස අල්ලාහ් ඔහුට අණ කළේ ය. ඒ සඳහා මග පෙන්වීමක් ඔහුට දෙන ලදි. කාන්තාරයේ නැවක් නිර්මාණය කිරීමේ ක්‍රියාව දිගු කලක් තිස්සේ සිදු විය. ඒ පසුකර යන කාෆිර්වරු ඔහු උපහාසයට ලක්කළහ. නබි නූහ් අලයිහිස්සලාම් තුමාණෝ එයට "අපි ඔබ දෙස බලා උපහාස කරන දවසක් පැමිණෙයි." යනුවෙන් පිළිතුරු දුන්හ.

දිනක් ළිපක් කැඩී ඒ තුළින් ජලය උතුරා ගලා යන්නට පටන් ගත්තේ ය. ඒ මොහොතේ ස්ත්‍රී පුරුෂ යුගල වශයෙන් සියලුම සතුන් මෙන්ම මුඃමින්වරු, තව ද ඊමාන් තැබූ නූහ් නබිගේ පවුලේ අය ද නැවට නැග ගන්නා ලෙස අල්ලාහ් අණ කළේ ය. මහා ජල ගැල්මක් ඇති විය. විශ්වාසවන්තයෝ "බිස්මිල්ලාහ්" කියා ගමන් කිරීමට පටන් ගත්තෝ ය. ජල ගැල්මෙන් කන්දක් සේ රැල්ලක් මැද නැව පාවුණේ ය. අයිනක එක් තැනක සිටගෙන සිටි පුතණුවන් දෙස බලා නබි නූහ් අලයිහිස්සලාම් "පුතේ, අප සමග නැවේ නැග ගන්න. කාෆිර්වරුන් සමග නොසිටින්න" යනුවෙන් ශබ්ද නගා පැවසුවේ ය. එවිට මුරණ්ඩුකාර පුතා "මම කන්දක් මත නැග දිවි බේරා ගන්නම්" යනුවෙන් පිළිතුරු දුන්නේ ය.

ඒ ක්ෂණයෙන් විශාල රැල්ලක් පැමිණ ඔහු හා ඔහු සමග සිටි අනෙකුත් කාෆිර්වරු ගසාගෙන ගියෝය. ඔවුහු සියලු දෙනා ම ජලයේ ගිලුණෝ ය. ජල ගැල්ම කෙමෙන් අඩුවන්නට පටන් ගත්තේ ය. අහස ජලය වත් නොකර නවතා ගත්තේ ය. පොළොව ජලය වාෂ්ප ලෙස උරා ඇතුළට ගත්තේ ය. ජූදි නම් කන්දේ නැව රැඳුණේ ය.



**ජූදි කන්ද හා නැව ගොඩ ගැසූ ස්ථානය**

මේ මොහොතේ නබි නූහ් අලයිහිස්සලාම් තුමාණන්ට පුතාගේ මතකය ආවේ ය. තමාගේ පවුලේ අය රැක දෙන බවට අල්ලාහ් දුන් පොරොන්දුව ඉටු නොකළ බවට චෝදනා කළේ ය. එයට අල්ලාහ් "ඉස්ලාමය පිළිනොගත් ඔහු නුඹගේ පවුලට අයත් වන්නෙක් නො වේ." යනුවෙන් පැවසුවේ ය. නූහ් නබි අලයිහිස්සලාම් තම චෝදනාව පිළිබඳ කම්පාවට පත් වී ඉස්තිඃෆාර් කළේ ය.

අවසාන වශයෙන් නබි නූහ් අලයිහිස්සලාම් තුමාණෝ, බේරුණු අය (ගැලවුණු අය) අමතා ප්‍රවේශමෙන් නැවතත් ගොඩ බසින ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියහ. පොළොවේ බරකත් ලැබූ නව ජීවිතයක් පටන් ගන්නා ලෙස ඔහු පැවසුවේ ය. එදා සිට එන මිනිස් පරපුර නූහ් නබි අලයිහිස්සලාම් තුමාගෙන් පැවත එන්නකි. මේ නිසා නබි නූහ් අලයිහිස්සලාම්, 'අබුල් බෂර් අස්සානි' (මිනිස් සංහතියේ දෙවෙනි පියා) යන අන්වර්ථ නාමයෙන් අමතන ලදි.

## අභ්‍යාසය

**හරිනම් (හ) ලකුණ ද වැරදි නම්( වැ) ලකුණ ද යොදන්න**

1. ඉස්ලාම් ලොවේ පූර්ණ කාලීන ආගමකි. ( )
2. ආදම් අලයිහිස්සලාම් තුමාගේ කාලයේ සිටම ෂිර්ක් ක්‍රියාව දක්නට ලැබුණි. ( )
3. නබි නූහ් අලයිහිස්සලාම් තුමාගේ පුතණුවන්ගෙන් කෙනකු කාෆිර් විය. ( )
4. මුහුදු වෙරළේ නැවක් තැනීමේ ක්‍රියාව සිදු කළහ. ( )
5. ජල ගැල්මෙන් නූහ් නබිතුමාගේ බිරිඳ ද ගිලී මිය ගියාය. ( )

**කෙටි පිළිතුරු සපයන්න**

1. නබි නූහ් අලයිහිස්සලාම් තුමාගේ විශේෂිත අන්වර්ථ නාමය කුමක්ද?
2. නබි නූහ් අලයිහිස්සලාම් තුමා වසර කීයක් ප්‍රචාරක ක්‍රියාවෙහි යෙදුනේද?
3. නබි නූහ් අලයිහිස්සලාම් තුමාගේ නැව රැදුණේ කුමන කන්දෙහිද?
4. නබි ෂීද් අලයිහිස්සලාම් තුමාට පසු මහජනතාවට මඟපෙන්වූ වියතුන් කවරහු ද?
5. නබි නූහ් අලයිහිස්සලාම් තුමාණන් ප්‍රචාරයේ නිරතවුණේ කෙසේ ද?